SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 14 S

නම ..............................................

**කතෝලික ධර්මය -I කොටස**

කාලය පැය දෙකයි

උපදෙස් : අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. හෙබ්‍රෙව් බසින් 'නබී' ලෙස හඳුන්වන්නේ ,

i. දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන තැනැත්තාය.
ii. දෙවියන් වහන්සේ අප සමඟය.
iii. දිවැසිවරයාය.
iv. දෙවියන් වහන්සේ අප ගළවන සේක.

02. ලේඛක දිවැසිවරයෙක් වන්නේ,

I. එළියා ය
ii. එළිෂා ය
iii. නාතාන් ය
iv. යෙසායා ය

03. දේශක දිවැසිවරයෙකු වන්නේ

I. යෙසායා ය
ii. එළියා ය
iii. එසකියෙල් ය
iv. ජෙරමියා ය

04. සුළු දිවැසිවරු ගණන වන්නේ,

i. 12 කි
ii. 03 කි
iii. 15 කි
iv. 07 කි

05. උපක්‍රමශීලීව දාවිත් රජතුමා කළ වරද පෙන්වා දුන් දිවැසිවරයා වන්නේ,

I. එළියා ය
ii. නාතාන් ය
iii. එසකියෙල් ය
iv. එළිෂා ය

06. එළිෂා දිවැසිවරයා විසින් කුෂ්ඨ රෝගය සුවකළ පුද්ගලයා වන්නේ,

i. ලාසරස් ය
ii. ජෝබ් ය
iii. නාමන් ය
iv. සාකෙවුස් ය

07. යෙසායා යන්නෙහි අර්ථය වන්නේ,

i. දෙවියන් වහන්සේ ගළවන සේක.
ii. දෙවියන් වහන්සේ උසස් කළ සේක.
iii. දෙවියන් වහන්සේ ශක්තිමත් කරන සේක.
iv. දෙවියන් වහන්සේ අප සමඟය.

08. දිවැසිවර ජෙරමියාගේ පියා වන්නේ,

i. බූසි ය
ii. හිල්කියා ය
iii. හාමන් ය
iv. නාතාන් ය

09. සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා ලෙස හඳුන්වන්නේ ,

i. ජෝනා ය
ii. හොසියා ය
iii. ආමොස් ය
iv. හබක්කුක් ය

10. මත්ස්‍යයකු විසින් ගිල තෙදිනකට පසු වමාරනු ලැබූ දිවැසිවරයා වන්නේ,

i. ජෝනා ය
ii. මීකා ය
iii. මලාකි ය
iv. හග්ගයි ය

(ල. 2 x 10 = 20)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

**අංක 01 - 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ලියන්න**

11. ආබ්‍රහම් තුමා ජීවත්වූයේ ................................................................ නම් ග්‍රාමයේය.

12. ආබ්‍රහම් තුමා දෙවියන් වහන්සේ සමග ඇති කරගත් ගිවිසුමේ බාහිර සළකුණ වන්නේ ................................................

13. ආබ්‍රහම් තුමාට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව අනුව ඇති වූ ජාතිය වන්නේ ............................................. යි.

14. ආබ්‍රහම්තුමාට සදාකාලයටම හිමිවන දේශයක් ලෙස දෙනු ලැබුවේ ................................................................ දේශයයි.

15. ආබ්‍රහම් යන්නෙහි අර්ථය ................................................................ යි.

| |
|---|
| චර්මඡේදනය, ඉශ්‍රායෙල් ජාතිය, ජාතීන්ගේ පියා, ඌර්, කනානිවරුන්ගේ, උතුම් පියා |

(ල. 2 x 5 = 10)

**අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

16. උඳුනෙන් හා ගිනිහුලෙන් සංකේතවත් කරන්නේ දෙවියන් වහන්සේය. (    )

17. දේශක දිවැසිවරුන් පිළිබඳව තොරතුරු සාමුවෙල් හා රාජාවලිය ග්‍රන්ථයන්හි සඳහන් වේ. (    )

18. ආබ්‍රහම් තුමාගෙන් පැවත ආ ජනතාව ප්‍රසාද ස්නාපනය කරනු ලැබීය. (    )

19. ඊසාක් උපත ලබන විට ආබ්‍රහම් තුමාගේ වයස අවුරුදු 90 කි . (    )

20. ආබ්‍රහම් තුමා ඊසාක් සමග දවන යාග පූජාවට සූදානම් කළ දර රැගෙන ගියේ මොරියා දේශයට ය. (    )

(ල. 2 x 5 = 10)

## II පත්‍රය

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01.
1. ලේඛක දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් 02 ක් නම් කරන්න .
2. ආබ්‍රම් හා ආබ්‍රහම් යන්නෙහි අර්ථ ලියන්න.
3. ආබ්‍රහම් තුමා සමග ඇතිකර ගත් ගිවිසුමේ වැදගත් කරුණු 02 ක් ලියන්න.
4. ආබ්‍රහම් තුමාගේ කැඳවීමේ අංග 02 ක් ලියන්න.
5. ආබ්‍රහම් තුමාට දෙවියන් වහන්සේ දුන් පොරොන්දු 02 ක් ලියන්න .
6. ලේඛක දිවැසිවරු දෙදෙනෙකු නම් කරන්න .
7. ජාකොබ්තුමාගේ දෙමව්පියන් නම් කරන්න.
8. රෙබෙකාට ලැබුණු නිවුන් දරුවන් නම් කරන්න.
9. 'බෙතෙල්' යන්නෙහි අර්ථය ලියා දක්වන්න.
10. දෙවියන් වහන්සේ ජාකොබ් තුමාට ලබා දුන් නම ලියා දක්වන්න.

(ල. 2 x 10 = 20)

02.
i. ඉශ්‍රායෙල් දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් 02 ක නම් කරන්න . (ල. 2)
ii. ප්‍රධාන දිවැසිවරු තිදෙනා නම් කරන්න. (ල. 3)
iii. දිවැසිවරුන්ගේ ජීවිත තුළින් ගත හැකි නායකත්වයේ ගුණාංග 05 ක් ලියන්න. (ල. 5)

(ල. 2 + 3 + 5 = 10)

03.
I. කාර්මෙල් කන්ද මත යාග සූදානම් කළ කණ්ඩායම් දෙක ලියන්න. (ල. 2)
ii. දේශක දිවැසිවරු තිදෙනා නම් කරන්න.
iii. ප්‍රසාද ස්නාපනය ලැබූ ඔබ දෙවියන් වහන්සේගේ බලයෙන් ශක්තිමත් වී ක්‍රියා කළ යුතු ආකාර 05 ක් ලියන්න.

(ල. 2 + 3 + 5 = 10)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

04. I. දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා කැඳවනු ලැබුවේ කුමක් සඳහා ද? (ල. 2)

ii. ආබ්‍රහම් තුමාට පරිත්‍යාග කිරීමට සිදු වූ දේවල් 03 ක් නම් කරන්න. (ල. 3)

iii. ආබ්‍රහම් තුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න. (ල. 5)

(ල. 2+3+5 = 10)

05. i. ඊසාක් යන්නෙහි අර්ථය ලියන්න. (ල. 2)

ii. ඊසාක්ගේ මෙහෙකරුවන් මිටියාවතේ ළිං කණින විට ඔවුන් සමග කළහ කළ පිරිස ලියන්න. (ල. 3)

iii. ඊසාක්ගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න. (ල. 5)

(ල. 2+3+5 = 10)

06. I. තත්වය මෙහෙම නම් මා ඉඳලා කුමකට දැ" යි පැවසුවේ කවුරුන් විසින් ද? (ල. 2)

ii. ඊසාක් ගේ දෙමව්පියන් නම් කරන්න. (ල. 3)

iii. වැරදි මාර්ගයේ ගිය මිතුරෙකු නිවැරදි මාර්ගයට ගැනීමට ඔබට දිය හැකි උපදෙස් 05 ක් ලියන්න.

(ල. 5)

(ල. 2+3+5 = 10)

SLGURU.LK
For Educational Purpose Only

“Education is the movement from darkness to light.” — Allan Bloom

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

# පළමු වාර පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය කතෝලික ධර්මය (පිළිතුරු පත්‍රය)

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | iii | 06. | iii | 11. | ඌර් | 16. | ✓ |
| 02. | iv | 07. | i | 12. | චර්ම ඡේදනය | 17. | ✓ |
| 03. | ii | 08. | ii | 13. | ඉශ්‍රායෙල් ජාතිය | 18. | × |
| 04. | i | 09. | iii | 14. | කහානිවරුන්ගේ | 19. | × |
| 05. | ii | 10. | i | 15. | ජාතීන්ගේ පියා | 20. | ✓ |

(ල. 2 x 20 = 40)

## II කොටස

01.

1. ප්‍රධාන දිවැසිවරු, සුළු දිවැසිවරු
2. උතුම් පියා - ආබ්‍රම්, ජාතීන්ගේ පියාණෝ - ආබ්‍රහම්
3. විශාල දරු පරපුරක් සදාකාලයටම හිමි වන දේශයක්
4. පරිත්‍යාගය, අභියෝගය
5. ආබ්‍රහම් තුමා මගින් විශාල ජාතියක් ඇති කිරීම, ආබ්‍රහම් තුමාගේ පෙළ පතට දේශයක් දීම.
6. යෙසායා, ජෙරමියා, එසකියෙල්
7. ඊසාක්/ රෙබෙකා
8. ජාකොබ්/ ඒසව්
9. දෙවියන් වහන්සේගේ ගෘහය
10. ඉශ්‍රායෙල්

(ල. 2x10=20)

2.

I . ප්‍රධාන/ සුළු

ii . යෙසායා, ජෙරමියා, එසකියෙල්

iii .
- ❖ සත්‍යයට සාක්ෂි දැරීම.
- ❖ අභියෝගවලට මුහුණ දීම
- ❖ දෙවියන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීම
- ❖ දේව ජීවිතයකට කැපවීම
- ❖ වගකීම් බාර ගැනීම

ආදී කරුණු ..........

(ල. 2 + 3 + 5 = 10)

03.

I . එළියා දිවැසිවරයා, බාල් දෙවියන්ගේ දිවැසිවරයා

ii . නාතාන්, එළියා, එළීෂා

iii .
- ❖ අභියෝගවලට මුහුණ දීම.
- ❖ වගකීම් බාර ගැනීම.
- ❖ සත්‍යයට සාක්ෂි දැරීම.
- ❖ වැරදි මාර්ගයට ඇදී යන පුද්ගලයන් නිවැරදි මාර්ගයට ගැනීම.
- ❖ ශුද්ධ වූ බයිබලයේ ඇති පණිවිඩය අන් අයට ප්‍රකාශ කිරීම.

ආදී කරුණු ..........

(ල. 2 + 3 + 5 = 10)

04.

I . ජේසුස් වහන්සේ මෙලොවට එවීම සඳහා ගැලවීමේ ඉතිහාසය සූදානම් කිරීමට ය

ii . තමාගේ මව්බිම, තමාගේ නෑදෑයින්, පියාගේ ගෘහය

iii .
- ❖ දෙවියන් වහන්සේ පිළිබඳ ව දැඩි විශ්වාසය.
- ❖ අභියෝග වලට මුහුණ දීම.
- ❖ පරිත්‍යාගශීලී බව.
- ❖ සත්‍යයට සාක්ෂි දැරීම.
- ❖ ජීවිතයේ මුල්තැන දෙවිඳුන්ට ලබා දීම.

ආදී කරුණු ..........

(ල. 2 + 3 + 5 = 10)

05.

I . සිනාසීම

ii . ගෙරාර්හි ගොපල්ලෝ

iii .
- ❖ දෙවියන් වහන්සේ කෙරෙහි අචල විශ්වාසය.
- ❖ දෙමව්පියන්ගේ අවවාද වලට කීකරු වීම.
- ❖ ජීවිතයට පැමිණෙන දුක් කරදර ඉවසීමෙන් දරා ගැනීම.
- ❖ දෙවියන් වහන්සේට යාච්ඤා කිරීම.
- ❖ අන්‍යයන් සමඟ ගැටුම් ඇතිකර නොගැනීම.

ආදී කරුණු ..........

(ල. 2 + 3 + 5 = 10)

06.

I . රෙබෙකා

ii . ආබ්‍රහම්/ සාරා

iii .
- ❖ වැරදි කරන විට දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාවය පළුදු වන බව.
- ❖ වැරදි කිරීමෙන් ස්වර්ග රාජ්‍යයට ඇතුළු වීමේ මාර්ගය අවහිර වන බව.
- ❖ සමාජයේ ගැරහුමට ලක් වන බව.
- ❖ යහපත් පාපොච්චාරණයක් කිරීම.
- ❖ වැරදි පිළිගැනීම.

ආදී කරුණු ..........

(ල. 2 + 3 + 5 = 10)

SLGURU.LK

For Educational Purpose Only